පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

නිපුණතාවය :**5.3.4. සත්ත්ව රාජධානියේ ශ්වසන ව්‍යුහවල විවිධත්වය**

ඇගයීම : 1. නිඩාරියා වැනි සතුන්ගේ වායු හුවමාරුව සඳහා සරල විසරණය ප්‍රමාණවත් වන්නේ ඇයි?

2. සතුන්ගේ ශ්වසන පෘෂ්ඨ විකසනය වීමේ වැදගත් කම් මොනවාද?

3. ශ්වසන පෘෂ්ඨ වල ලාක්ෂණික ලක්ෂණ මොනවාද?

4. සත්ත්ව රාජධානිය තුළ හමුවන විවිධ ශ්වසන ව්‍යුහ හා ඒවා දරන ජීවී කාණ්ඩ වලට උදාහරණ ලබා දෙන්න.

නිපුණතාවය : **5.3.5. මිනිසාගේ ශ්වසන පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍ය**

ඇගයීම : 1. මානව ශ්වසන පද්ධතියේ නම් කරන ලද රූප සටහනක් අඳින්න.

2. මානව ශ්වසන පද්ධතිය සමන්විත වන ප්‍රධාන කොටස් සඳහන් කරන්න.

3. පෙනහැලි වට වී පවතින පටල දෙක නම් කරන්න.

4. ස්වරාලයේ කාර්‍ය කුමක්ද?

5. ස්වරාලයේ හා ශ්වාස නාලයේ බිත්ති කාටිලේජ මඟින් ශක්තිමත් වී තිබීම වැදගත් වන්නේ ඇයි?

6. කාර්‍යක්ෂම වායු හුවමාරුවක් සඳහා මිනිසාගෙ ශ්වසන පෘෂ්ඨය දරන අනුවර්තන

7. සරෆැක්ටන්ට් වල කාර්‍ය කුමක්ද?

8. මිනිසාගේ පෙනහළු වාතනය වීමේ යාන්ත්‍රණය විස්තර කරන්න.

9. ගැඹුරු ආශ්වාසයකදී දායකවන පේශි වර්ග මොනවාද?

10. බාහිර ශ්වසනය හා අභ්‍යන්තර ශ්වසනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න,

Refference : ජීව විද්‍යාව සම්පත් පොත, 5 වන ඒකකය පිටු අංක 210-217

සැකසුම : ගෞරි අනුපමා විජේසිංහ. කෑ/මාව පින්නවල මධ්‍ය මහා විද්‍යාලය, රඹුක්කන.